සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2019(I)**

| | | |
|---|---|---|
| කාලය : පැය 03 | ආර්ථික විද්‍යාව සහ සමාජ විද්‍යාව - 03 | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>..................................... |

- එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

**(අ) කොටස**

1. i. සෑම ආර්ථිකයකටම මුහුණ පෑමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

   ii. ආර්ථික පද්ධතියක තීරණ ගන්නා විශේෂ පාර්ශව හඳුන්වා එම පාර්ශව වල කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 15)

2. i. නිෂ්පාදන පිරිවැය කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ii. දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පැහැදිලි කර, පරිමාණුකූල පිරිමැසුම් සහ පරිමාණුකූල නොපිරිමැසුම් අතර දෝලනය විග්‍රහ කරන්න. (ලකුණු 15)

3. i. මුදලට ඉල්ලුමක් ඇති වීමට බලපාන හේතු පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ii. ශ්‍රී ලංකා මහබැංකුව විසින් 2022 අගෝස්තු 31 දින නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයක කොටසක් පහත දැක්වේ.

   **“කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 ජූලි මාසයේ පැවති සියයට 60.8හි සිට 2022 අගෝස්තු මාසයේ දී සියයට 64.3ක් දක්වා ඉහළ ගියේය”**

   උද්ධමන අනුපාතිකයේ වේගය අනුව උද්ධමනය වර්ග කරන්න. උද්ධමන පාලනය කිරීම සඳහා යෝග්‍ය ආර්ථික ප්‍රතිපත්ති, ඉහත උපුටනයෙන් දැක්වෙන ශ්‍රී ලංකා ආර්ථික සන්දර්භය අළලා විග්‍රහ කරන්න. (ලකුණු 15)

4. 2022 වර්ෂය සඳහා රජය විසින් මෑතකදී ඉදිරිපත් කරන ලද "අතුරු අයවැය කතාවේ" සඳහන් යෝජනාවකට අනුව" 2025 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2කට වඩා වැඩි ප්‍රාථමික අතිරික්තයක් ඉලක්ක කර ගැනීමත් ඉන් පසුව එම මට්ටම තව දුරටත් පවත්වාගැනීමටත් " අපේක්ෂා කර ඇත.

   ප්‍රාථමික අතිරික්තය යනු කුමක්දැයි හඳුන්වා උක්ත ඉලක්කය ළඟා කර ගැනීමේදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කෙසේ හැසිරවිය යුතුදැයි විශ්ලේෂණාත්මක ඇගයීමකට ලක් කරන්න. (ලකුණු 25)

## (ආ) කොටස

1. i. පවුලේ ප්‍රධාන සමාජ කෘත්‍යයන් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

   ii. ඉහත කෘත්‍යයන් ඉටු කිරීමේදී පැන නැගිය හැකි සමාජමය ගැටලු සාකච්ඡා කරන්න. (ලකුණු 13)

2. i. සංස්කෘතියේ මූලික ලක්ෂණ පහදන්න. (ලකුණු 10)

   ii. සංස්කෘතික විපර්යාස හේතුවෙන් මතුවන සාරධර්ම ගැටුම ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් පහදන්න. (ලකුණු 15)

3. i. නිලබලවාදී සංවිධාන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ii. ශ්‍රී ලංකාවේ නිලබලවාදී සංවිධානවල පවත්නා ප්‍රායෝගික ගැටලු රාජ්‍ය අංශය කෙරෙහි අවධානය යොමු කරමින් විස්තර කරන්න. (ලකුණු 15)

4. i. නූතන ශ්‍රී ලාංකේය සමාජයේ මානව සම්බන්ධතාවලට අදාළව පවත්නා "අර්බුදකාරී තත්ත්වයක" මූලික ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 12)

   ii. මානව සම්බන්ධතා සමාජ ප්‍රාග්ධනයක් බවට පරිවර්තනය කර ගැනීමේ හැකියාව සාම්ප්‍රදායික සමාජය උදාහරණයට ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 13)

************